# කුරුණෑගල රිදී විහාරයේ දීඝ නිකාය පුස්කොළ ග්‍රන්ථය පිළිබඳව කෙරෙන අභිලේඛන විද්‍යාත්මක අධ්‍යයනයක්

**වීරකෝන් ඒ.එම්.එම්.**[1]

මානවයාගේ අතීතය හදාරන පුරාවිද්‍යාව තුළ මූලාශ්‍රය යන්න වැදගත් සාධකයකි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය යටතේ, පැරණි ලේඛන යන අරුත් දෙන අභිලේඛන වලට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. ලේඛනවල අන්තර්ගතය, අයත්වන කාලය, ඉතිහාසය ලිවීමට යොදාගැනීම යනාදිය එහිදී අධ්‍යයනයට බඳුන්වන අතර මෙම අධ්‍යයනයේ දී එවැනි වූ අභිලේඛනයක් වන වයඹ පළාතට අයත් කුරුණෑගල රිදී විහාරයේ ඇති දීඝනිකාය පුස්කොළ ග්‍රන්ථය පිළිබඳ ව අභිලේඛන විද්‍යාත්මකව විමර්ශනය කිරීම අරමුණ වේ. මෙහිදී ස්ථානීය ගවේෂණ ක්‍රමවේදය යටතේ දත්ත ඒකරාශි කර පුස්තකාල අධ්‍යයන මඟින් ද තොරතුරු රැස් කරගත් අතර ඒ තුළින් අධ්‍යයනය සාර්ථක කර ගැනීම අභිප්‍රාය විය. බුදුන්ගේ ධර්මය සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයකින් සමන්විත මෙහි සූත්‍ර පිටකයට අයත් දීර්ඝ වූ සූත්‍ර වලින් සමන්විත දීඝ නිකාය ශකවර්ෂ 1666 ට හෙවත් ක්‍රි.ව 1744 ට අයත් පැරණිතම පුස්කොළ ග්‍රන්ථයක් වශයෙන් තිබ්බොටුවාවේ සාමණේර හිමියන් විසින් රචිත, වළගම්බා රජු දවස මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කරන්නක් ලෙසට හැඳින්වේ. වර්තමානයේ දී පරිශීලනයට ඉතා හොඳ තත්වයේ පවතින පිටපතක් වන මෙය සාම්ප්‍රදායික සිතුවමින් විසිතුරු වූ කම්බා යුගලකින් සමන්විත මෙහි ආශිර්වාදයත්, පිටු අංකයත් දක්වමින් බ්‍රාහ්මජාල සූත්‍රයෙන් ඇරඹී අගනා පුස්කොළ පිටපතක් වශයෙන් දැක්විය හැකිය. බොහෝ පුස්කොළ රචකයින් එකල පැවති සමාජ තත්වය විග්‍රහා කළ අතර මෙහිදී ශ්‍රී විජය රාජසිංහ රජු සමයෙහි ශාසනය පිරිහී තිබුණු හෙයින් ශාසනයේ පිනට පහළ වූ සරණංකර හිමියන්ගේ ශිෂ්‍ය තිබ්බොටුවාවේ සාමණේර හිමියන් විසින් මෙම දීඝනිකාය ලියා අවසන් කළ බවත් දැක්වේ. මූලික කොටස් තුනකින්, සූත්‍ර 33 කින් සමන්විත මෙහි අක්ෂර පිළිබඳව සැලකීමේ දී තුඩු සහිත, සිහින්, පටු, හංසාක්ෂර ශෛලියෙන් යුතුව, කුණ්ඩලය, පෙයියාලම, කාකපාදය යන විරාම ලක්ෂණයන්ගේ භාවිතය ද දැකීමට පුළුවන. මෙහි අභිලේඛන විද්‍යාත්මක බව සැලකීමේදී අතීතය හා වර්තමානය අතර සබැඳියාවක් එනම් සමකාලීන වීමක් දැකිය හැකි අතර, මෙම දීඝනිකායේ සෑම සූත්‍රයක්ම ත්‍රිවිධ ශිලයෙන් යුක්තව බුද්ධ කාලයේ සමාජ, ආර්ථික, ආගමික, දේශපාලනික කරුණු වර්තමානයට ගලපා, ඒ අනුව ක්‍රියා කිරීමට මිනිසුන් පෙළඹවීම තුළ එය සමාජයේ දියුණුවට මෙන්ම සංවර්ධනයට ද රුකුලක් වූ බව අග්ගඤ්ඤ සූත්‍රය, චක්කවත්තිසීහනාද සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය වැනි සූත්‍ර තුළින් නිදසුන් සපයනු ලබයි. මේ අනුව බැලීමේ දී මෙහි අන්තර්ගත කරුණු අතින් ගත්කළ බුදුන්ගේ ධර්මය එක්තැන් වූවක් මෙන්ම සමාජයට ආදර්ශයක් ගෙන දෙන්නක් ලෙසට මෙම පුස්කොළ පිටපත සාක්ෂි සපයනු ලබයි.

**මුඛ්‍ය පද :** දීඝනිකාය, අභිලේඛන, රිදී විහාරය, පුස්කොළ, ත්‍රිපිටක

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
maheshika552@gmail.com